**සමිඳාණන්ගේ ස්වර්ගාරෝහණ මංගලෝත්සවය** | **දේව ප්‍රකාශන** | 12-05-13

## පළමුවන දේව ප්‍රකාශනය

ක්‍රියා 1:1-11

අපෝසතුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

**ඔවුන් බලා සිටියදීම ස්වාමින් වහන්සේ ස්වර්ගයට නැඟුණු සේක.**

තියෝපිලස් තුමෙනි, ජේසුස් වහන්සේ කළාවූද ඉගැන්නුවාවූද සියලු දේ, මුලසිටම උන්වහන්සේ තෝරාගත් අපෝස්තුළුවරුන්ට ශුද්ධාත්මයාණන් කරණකොටගෙන අණ දී උන්වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබූ දවස දක්වා මාගේ ප්‍රථම කෘතියෙහි මම විස්තර කළෙමි. උන්වහන්සේගේ මරණයෙන් පසු සතළිස් දවසක් අතරතුර ඔවුනට දර්ශනය වෙමින් ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන දේශනාකරමින් ද බොහෝ නිසැක සාක්ෂිවලින් උන්වහන්සේ ජීවමානව ප්‍රකාශ වූ සේක. උන්වහන්සේ ඔවුන් සමග ආහාර වළඳමින් සිටියදී ඔවුන් අමතා, "ඔබ ජෙරුසලමෙන් ඉවත්ව නොගොස්, මා වදාළ පරිදි පියාණන් වහන්සේගේ පොරොන්දුව බලාපොරොත්තුවෙන් සිටින්න. මන්ද. ජොහාන් වතුරෙන් බෞතීස්ම ස්නාපනය කළේය. එහෙත් මින් නොබෝ දවසකින් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් බෞතීස්ම ස්නාපනය කරනු ලබන්නහු ය."යි වදාළ සේක. අපෝස්තුළුවරුන් එක්රුස්වූ කළ, "ස්වාමිනි, ඔබ යළිත් ඊශ්‍රායෙල් රාජ්‍ය පිහිටුවන කාලය මෙය ද?"යි ඔවුහු උන්වහන්සේ ගෙන් ඇසූහ. උන්වහන්සේ පිළිතුරු දෙමින්, "පියාණන් වහන්සේ ස්වකීය ආධිපත්‍යයෙන් නියම කළ කාලයන් ද, අවස්ථාවන් ද දැනගැනීම ඔබට අයිති කාරියක් නොවේ. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කළ ඔබ බලය ලබන්නහුය. එවිට ඔබ ජෙරුසලමෙහිද, මුළු ජුදයෙහි හා සමාරියෙහි ද, පොළොවේ සීමාන්තයන් දක්වා ද, මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය."යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා ඔවුන් බලාසිටියදී ම ඔසවාගනු ලැබ, වලාකුළකින් වැසී ඔවුනට නොපෙනී ගිය සේක. උන්වහන්සේ යන කළ, ඔවුන් අහස දෙස බලාගෙන සිටියදී, සුදු වතින් සැරසුණු මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිට, "ගලීලයේ වැසියෙනි, ඔබ අහස දෙස බලාගෙන සිටින්නේ කුමටද? ඔබ කෙරෙන් ඔසවා ගනු ලැබූ මෙම ජේසුස් වහන්සේ ස්වර්ගයට නගිනු දුටු සේම ආපසු වඩිනු ඇත."යි කීහ.

දේව වාක්‍යය එසේ ය. — දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 47:1-2, 5-8

පිළිතුර: දෙවිතුමන් හට පැසසුම් ගී ගයන්න.

ගීය:

සව් සතුනි, අත් පොළසන් දෙන්න. ජය සෝෂා නංවා දෙවිඳුන්ට තුති දෙන්න. අති උතුම් සමිඳාණෝ බියකරු ය. මුලු මහ පොළොව කෙරේ අග රජය.

ජය ගොස නංවා, කාහල හඬ පතුරා එතුමාණෝ සිහසුන මත නැගුණ සේක. දෙවිතුමන් හට ගී පසස් නගන්න. ගී පසස් නගන්න. අපේ නිරිඳු හට ගී පසස් නගන්න.

දෙවිඳාණෝ මුළු දෙරණට නිරිඳාණෝ ය. එතුමන් හට ගී පැසසුම් ගයන්න. දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝ ය. එතුමාණෝ සුවිශුද්ධ සිහසුන් අරා වැඩ සිටින සේක.

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 9:24-28, 10:19-23

හෙබ්‍රෙව්වරුනට ලියන ලද හසුනෙන් කොටසකි.

**"දෙවියන් වහන්සේ අබිමුවෙහි පෙනී සිටින පිණිස ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගයට ම ඇතුළු වූ සේක."**

තේජසේ පියාණන් වූ, අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දෙවියන් වහන්සේ, උන් වහන්සේ අවබෝධ කරගැනීම පිණිස, ප්‍රඥාව හා විදර්ශන ශක්තිය

ඔබට දෙන මෙන් මම යාච්ඤා කරමි. තවද, උන් වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක් ද කියාත්, සැදැහැවතුන්ට හිමි වන තේජාන්විත උරුමයේ ධන සම්භාරය කිමෙක් ද කියාත්, ඇදහිලිවන්තයන් වන අප තුළ ක්‍රියා කරන, උන් වහන්සේගේ බලපරාක්‍රමයේ උදාරබව කිමෙක් ද කියාත්, ඔබ දැන ගන්නා පිණිස ඔබේ මනස පැහැදෙනසේ මම යාච්ඤා කරමි. දෙවියන් වහන්සේගේ ඒ වික්‍රමාන්විත බලපරාක්‍රමය නම්, උන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ මරණයෙන් උත්ථාන කර, ස්වර්ග ලෝකයෙහි ස්වකීය දකුණු පස සිංහාසනාරූඪ කිරීමෙන්, ක්‍රිස්තුන් වහන්සේ තුළ උන් වහන්සේ ඉටු කළ ක්‍රියාකාරී බලය ම ය. එම ක්‍රිස්තුන් වහන්සේ සියලු අධිපතීන්ටත්, බලධාරීන්ටත්, පරාක්‍රමවලටත්, අධිකාරීන්ටත්, එසේ ම, මේ යුගයේ පමණක් නොව, මතු පැමිණෙන යුගයෙහි ද, නම් කළ හැකි තාක් සියලු ප්‍රභූ නාමයන්ටත් ඉහළින් වැජඹෙන සේක. දෙවියන් වහන්සේ සියලු දේ ක්‍රිස්තුන් වහන්සේගේ පාදවලට යටත් කර, උන් වහන්සේ සභාවේ මහේශාක්‍ය නායකයාණන් කොට පත් කළ සේක. සභාව උන් වහන්සේගේ ශරීරය ය. ශරීරය එහි හිස වන, සියල්ල බද්ධ කරන, ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වූ විට, එක ම සර්ව සම්පූර්ණත්වයක් ඇති වේ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 24:32

ආලේලූයා! ආලේලූයා!
ඔබ ගොස්, සකල ජාතීන් ගෝලයන් කරන්න. මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න. මම ද සදහට ම ඔබ හා සමග සිටිමි.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 24:46-53

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**උන් වහන්සේ ඔවුන්ට ආශීර්වාද කරත් ම ස්වර්ගයට ඔසවනු ලැබූ හ.**

"මෙසේ ක්‍රිස්තුන් වහන්සේ වද විඳින්ටත් තුන් වන දා මළවුන්ගෙන් නැඟිටින්ටත්, ජෙරුසලමෙන් පටන්ගෙන සකල ලෝකවාසීන්ට මනස්ස්ථාපනය ද පව් කමාව ද, උන් වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නට ද යුතු ම යයි ලියා ඇත. ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නහු ය. බලන්න, මම මාගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව ඔබ වෙත ගෙනෙමි. එහෙත්, ඉහළින් වන බලපරාක්‍රමයෙන් ඔබ හැම සන්නද්ධ කරනු ලබන තුරු නගරයෙහි නැවතී සිටින්නැ"යි වදාළ සේක. උන් වහන්සේ බෙතානිය දක්වා, ඔවුන් කැඳවාගෙන ගොස්, තමන්ගේ අත් ඔසවා ඔවුන්ට ආශීර්වාද කළ සේක. එසේ ආශීර්වාද කරද්දී ම, උන් වහන්සේ ඔවුන් කෙරෙන් වෙන් ව, ස්වර්ගයට ඔසවාගනු ලැබූ සේක. ඔව්හු උන් වහන්සේට නමස්කාර කොට, ඉමහත් ප්‍රීතියකින් ජෙරුසලමට හැරී අවුත්, නිරතුරු දේව මාලිගාවෙහි දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් කල් ගත කළහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.